සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

## නාට්‍ය හා රංග කලාව I

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න

1. නාට්‍ය පෙළ යනු
   i තිර පිටපතයි ii කාර්මික පිටපතයි iii නාට්‍ය පිටපතයි iv රංගාලෝකයයි

2. නාට්‍යයකට නළු නිළියන් තෝරා ගැනීම.
   i අනුකරණයයි ii සමාරෝපයයි iii අනුරූපණයයි iv නළුවරණයයි

3. නාට්‍ය පිටපතක් නිර්මාණයේ දී වැදගත් වන අභිනයකි
   i ආංගික ii වාචික iii සාත්වික iv ආහාර්ය

4. නාට්‍යයකට පාදක වන කතා තේම
   i හාස්‍ය උපදවන සුළු විය යුතුය
   ii හැඟීම් අවුස්සන සුළු විය යුතුය
   iii සදාතනික ගුණයෙන් යුක්ත විය යුතුයි
   iv එක් පිරිසකට සීමා විය යුතුයි

5. රූපණය යනුවෙන් හඳුන්වන්නේ
   i රඟපෑමයි
   ii රූප ඇඳීමයි
   iii රූප වර්ණ ගැන්වීමයි
   iv ඉහත කිසිවක් නොවේ

6. අංග, ප්‍රත්‍යාංග, උපාංග අයත් වන්නේ
   i ආංගික අභිනයටය
   ii වාචික අභිනයටය
   iii සාත්වික අභිනයටය
   iv ආහාර්ය අභිනයටය

7. මාෂා හා වලහා නාට්‍ය නිර්මාණය කළේ
   i සෝමලතා සුබසිංහ මහත්මිය විසිනි
   ii පාලිත ලොකුපෝතාගම මහතා විසිනි
   iii එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසිනි
   iv ඩී. කුමාරගේ මහතා විසිනි

8. නාට්‍ය පෙළ තුළ ඇතුළත් අංගයක් නොවන්නේ
   i චරිත ii සංවාද iii සංගීතය iv රංග විධාන

9. වේෂ භූෂණ යනුවෙන් හඳුන්වන්නේ
   i චරිත නිරූපණයයි
   ii මුහුණ සකස් කිරීමටයි
   iii පසුතල නිර්මාණය
   iv ඇඳුම් පැළඳුම් නිර්මාණයයි

10. නාට්‍ය පෙළ රචනයේදී පරිකල්පනය වඩා වැදගත් වේ. ඉන් අදහස් වන්නේ
    i දී ඇති කතාව ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කිරීම
    ii අලුතින් යමක් සිතා නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම
    iii ගැටුම් සහිත නාට්‍ය පෝෂණය කිරීම
    iv චරිත අතර අන්‍යෝන්‍ය සම්බන්ධය ඇති කිරීම

11. නිශ්චල රංග රූප හෙවත් නිසල රූ යනු
i සංවාද සහිත චලන රහිත රංග ඉරියව්
ii සංවාද සහ චලන සහිත රංග ඉරියව්
iii සංවාද සහ චලන රහිත රංග ඉරියව්
iv සංවාද රහිත චලන සහිත රංග ඉරියව්

12. අභිරූපණ රංගනයේදී අදාල නොවන අභිනයක් වන්නේ
i ආංගික අභිනයයි
ii වාචික අභිනයයි
iii සාත්වික අභිනයයි
iv ආහාර්ය අභිනයයි

13. සිරුරේ සියලු අඟ පසඟ සහිතව ශරීරය සම්පූර්ණයෙන් ම සැහැල්ලු වීම
i ශිථිලීකරණ අභ්‍යාසයයි
ii දර්පණ අභ්‍යාසයයි
iii ස්වසන අභ්‍යාසයයි
iv තාපන අභ්‍යාසයයි

14. සන්තානම් පල්ලි යන්න
ලේ ලකඩි ලේ ලෝ ... යන කවිය අයත් වන්නේ
i යාතුකර්ම කවියකි
ii වැදි ගීයකි
iii පාරු කවියකි
iv දැල් ගීයකි

15. ඉග්නේෂ් ලොයෙලා මුනිවරයාගේ කතාව තේමාකොට නිෂ්පාදිත නාට්‍ය වන්නේ
i ස්වර්ණතිලකා
ii සඳකිඳුරු
iii සාන්තුවර සෙබළාණෝ
iv සකල ජන

16 - 20 දක්වා දී ඇති ප්‍රකාශ හරිනම් (√) ලකුණ ද වැරදි නම් වැරදි (x) ලකුණ ද යොදන්න

16. පරිකල්පනය පුද්ගලබද්ධ නොවේ ( )

17. බුද්ධ ගජ්ඣය කටහඬ අභ්‍යාස වලට අයත් වේ ( )

18. රංගනයේ දී මනස හා ශරීරය අතර සම්බන්ධතාවය ඉතා වැදගත් වේ ( )

19. චරිතයක බාහිර මෙන්ම අභ්‍යන්තර ලක්ෂණ ද දැකිය හැක ( )

20. නාට්‍ය සංගීතය වාචික අභිනයට අයත් වේ ( )

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

## නාට්‍ය හා රංග කලාව II

● පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ද ඇතුළත්ව ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන සංවාද කොටස ඇසුරින් පිළිතුරු සපයන්න

A - අනේ වලස් රාළහාමි (අඩමින්) ... මට ගෙදර යන්න ඕනා. මගේ ආච්චි මම එනකන් බයේ ඇති අනේ ...
B - (ඇද කරයි)
ඈ ... හොහ් ... හොහ්
A - මට ගෙදර යන්න ඕ ... නා ... (අඬයි)
B - හොඳයි. මම පාර කියන්නම් ... හැබැයි මං අහන ඒවාට උත්තර දෙන්න ඕනා

i මෙහි A හා B යන චරිත දෙක නම් කරන්න (ලකුණු 02)
ii මෙම කොටස උපුටාගත් නාට්‍ය නම් කරන්න (ලකුණු 01)
iii ඉහත කොටසෙහි ඇතුළත් රංග විධාන 02ක් ලියන්න (ලකුණු 02)
iv මෙම නාට්‍යයේ තේමා 02ක් ලියන්න (ලකුණු 02)
v නාට්‍යයේ සිද්ධි පෙළගැසී ඇති ආකාරය කෙටියෙන් ලියන්න (ලකුණු 03)
(ලකුණු 10)

02 i වේෂ භූෂණ යන්න හඳුන්වන්න (ලකුණු 02)
ii වේෂ භූෂණ නිර්මාණයේ දි සැලකිලිමත් විය යුතු කරුණු 04ක් ලියන්න (ලකුණු 04)
iii රජ හෝ රජ බිසව චරිතයට සුදුසු වේෂ භූෂණ ඇඳ දක්වන්න (ලකුණු 04)

03 i රංග අභ්‍යාස යනු කුමක්ද (ලකුණු 02)
ii රංග අභ්‍යාස වර්ග 04 නම් කරන්න (ලකුණු 04)
iii පංති කාමරයේදී ඔබ විසින් සිදු කරන ලද රංග අභ්‍යාසයක් විස්තර කර ලියන්න (ලකුණු 04)

04 i යාතු කර්ම ගී යනුවෙන් හඳුන්වන්නේ මොනවාද? (ලකුණු 02)
ii යාතු කර්ම ගී ගායනා තුළ දැකිය හැකි විශේෂණ 03ක් ලියන්න (ලකුණු 03)
iii ඔබ දන්නා යාතු කර්ම ගීයක් ලියන්න (ලකුණු 05)

05 පහත සඳහන් තේමාවන්ගෙන් එක් තේමාවක් තෝරා ගෙන රංග විධාන, ගැටුම්, සංවාද සහිතව නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න
- වෛරයෙන් වෛරය නොසන්සිඳේ (ලකුණු 10)
- ඉවසීමෙන් සැනසීම ලැබේ
- කළකම් පළ දේ
- හිටියොත් හොඳට හැදී දෙවියොත් නමට වඳී

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

# නාට්‍ය හා රංග කලාව

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | iii | 2. | iv | 3. | ii | 4. | iii | 5. | i |
| 6. | i | 7. | iv | 8. | iii | 9. | iv | 10. | ii |
| 11. | iii | 12. | ii | 13. | i | 14. | iv | 15. | iii |
| 16. | x | 17. | √ | 18. | √ | 19. | √ | 20. | x |

### II කොටස

1.
i A - මාෂා B වලහා ii වලහා හා මාෂා නාට්‍ය iii අඩමින්, ඇද කරයි, අඬයි

iv නපුරු ළමයින් නිරන්තරයෙන් ප්‍රතික්ෂේප වන බව
අවිහිංසාවාදී වීම
දෙමාපියන්ට වැඩිහිටියන්ට කීකරු වීම

v වලහාගේ නිවසට මාෂා පැමිණීම, මී වද කෑම, නිදා ගැනීම, වලහාගේ පැමිණීම හා මාෂා අසුවීම,මී මැස්සන් පැමිණීම, ආච්චි බැලීමට යාම, මාෂා බේරීම

02 i නළුවන් රංගනයේදී භාවිතයට ගන්නා වස්ත්‍ර හා ආභරණ වේෂ භූෂණ නම් වේ (ලකුණු 02)
ii චරිත ස්වභාවය බාධාවක් නොවීම, ශෛලියට යුගයට ගැලපෙන බව, පහසුවෙන් ඇද පැළඳ ගැනීම වැනි කරුණු (ලකුණු 04)
iii පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න (ලකුණු 04)

03 i ආධුනික නළුවෙකු රංගනයට පිවිසීමට පෙර තම කායික හා මානසික සමබරතාවය ඇති කර ගැනීම සඳහා සිදුකරන අභ්‍යාස වේ (ලකුණු 02)
ii කටහඬ අභ්‍යාස, ශිථිලිකරණ අභ්‍යාස, ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාස, මානසික අභ්‍යාස, දර්ෂණ අභ්‍යාස (ලකුණු 04)
iii පංති කාමරයේදී සිදු කරන ලද රංග අභ්‍යාසයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න (ලකුණු 04)

04 i සෙතක් ශාන්තියක් අපේක්ෂාවෙන් පවත්වනු ලබන ශාන්ති කර්ම හෙවත් යාතු කර්ම වලදී ගායනා කරනු ලබන ගී (ලකුණු 02)
ii බෙර හඬ අභිභවා ගායනා කිරීම
රංගනයේ යෙදෙමින් ගායනා කිරීම
බෙර තාලයට අනුව ගායනා කිරීම (ලකුණු 03)
iii නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න (ලකුණු 05)

05 මාතෘකාව, චරිත, සංවාද, රංග විධාන, ගැටුම් අවස්ථා ඇතුළුව පෙළ නිර්මාණය ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න (ලකුණු 10)